## පළාත් අධ්‍යාපන
## දෙපාර්තමේන්තුව සබරගමුව සති

සතිය :- 01

විෂය:- **පෙරදිග සංගීතය**

ශ්‍රේණිය :- 10

Prepared by- H.D.V.K.C.Ilangarathna
(Music Teacher:- Ke/Dehi/Gonagala K.V.

### ***ස්වර ලිපි කියවීමේ ක්‍රම ශිල්ප*** - (සුළු තනිතිත/2/4 Beat /ලාවනී තාලය)

මෙම සතියේ දී මාත්‍රා දෙකෙන් දෙකට (සුළු තනිතිත / 2/4 Beat ) ලාවනී තාලය ට ස්වර ප්‍රස්ථාර කරන ආකාරය පිළිබඳ ව විමසා බලමු. පහත දැක්වෙන්නේඑක් විභාගයක මාත්‍රා දෙක බැගින් බෙදෙන ස්වර ප්‍රස්ථාරයකි. ස්වර ප්‍රස්ථාරය කියවන්නේ වමේ සිට දකුණට ය.

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| X | | X | | X | | X | |
| 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 | 8 |
| වන් | වූ | වන් | වූ | වන් | වූ | වන් | වූ |

ඉහත ප්‍රස්ථාරයේ x සළකුණ තිබෙන ස්ථානයේ මාත්‍රාව ට අත්පුඩි ගසමින් වන් , වූ, වන්, වූ යනුවෙන් තාලයට හඬ නගන්න. කිහිපවරක් කරන්න. පහතින් දක්වා ඇත්තේ මාත්‍රා දෙකෙන් දෙකට විභාග කරන ලද ප්‍රස්ථාරයක විවිධ මාත්‍රා වටිනාකම් සහිත ස්වර ප්‍රස්ථාරයකි.

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| X | | X | | X | | X | |
| 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 | 8 |
| ස | - | සරි | ස | + | ග+ | ගරි | ස |

පළමු මාත්‍රාවේ වයන ස ස්වරය නොකඩවා දෙවන මාත්‍රාව අවසන් වන තෙක් වයන්න.

තෙවන මාත්‍රාවේ පළමු භාගය ස ස්වරයත් දෙවන භාගය රි ස්වරයත් වයන්න

පස්වන මාත්‍රාව නිහඬ ව ඉන්න. නොවයන්න.

හයවන මාත්‍රාවේ පළමු භාගය වයා දෙවන භාගය නිහඬ ව ඉන්න. නොවයන්න.

❖ ඉහත උදාහරණ ආදර්ශයට ගනිමින් පහත ස්වර ප්‍රස්ථාරය වාදනය කරන්න.

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| X | | X | | X | | X | |
| 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 | 8 |
| ස | ස | සරි | ග | ග+ | ගරි | ස | - |
| රි | - | ප | - | ප | ම | ග | - |
| ප | ප | ම | ම | ග | ග | රි | - |
| ස | රි | ග | රි | ස | - | - | - |